# බස්නාහිර පළාත් ලේකම්වරුන්ගේ රැස්වීම් වාර්තාව

දිනය : 2022.02.15

වේලාව : පෙ.ව.9.30

ස්ථානය : ප්‍රධාන ලේකම් රැස්වීම් ශාලාව

මූලාසනය : ජේ.එම්.සී.ජයන්ති විජේතුංග මහත්මිය (ප්‍රධාන ලේකම්)

සහභාගී වූ නිලධාරීන්ගේ නාම ලේඛනය

01) තිලක් සෙනරත් මහතා - ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව(බ.ප)

02) යූ.බී.ආර්.රාජපක්ෂ මහතා - සභා ලේකම්,සභා ලේකම් කාර්යාලය(බ.ප)

03) ඒ.ඩී.එස්.සදිකා මිය - ලේකම්,පළාත් පාලන අමාත්‍යාංශය(බ.ප)

04) සිරිසෝම ලොකුවිතාන මහතා - ලේකම්,අධ්‍යාපන අමාත්‍යාංශය(බ.ප)

05) ගාමිණී ධර්මසේන මහතා - ලේකම්,සෞඛ්‍ය අමාත්‍යාංශය(බ.ප)

06) ඩබ්ලිව්.එම්.දයාවතී මිය - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)

07) ඩබ්ලිව්.ටී.ඒ.මානෙල් මිය - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)

08) ඒ.එම්.එස්.මල්කාන්ති මිය - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය)

09) ජී.ඩබ්ලිව්.පී.පෙරේරා මිය - වැ.බ. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)

10) කේ.ඒ.ඩී.කේ.සිරිවර්ධන මහතා - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්)

11) පාලිත අබේවර්ධන මහතා - ප්‍රධාන නීති නිලධාරී

12) ආර්.ඒ.ජී.එම්.බණ්ඩාර මහතා - සහකාර ලේකම්(කෘෂිකර්ම අමාත්‍යාංශය)

13) කේ.එන්.සූරියආරච්චි මිය - සහකාර ප්‍රධාන ලේකම් (පාලන)

14) පේෂලා අබේසූරිය මිය - සහකාර ප්‍රධාන ලේකම් (පාලන)

ප්‍රධාන ලේකම්තුමියගේ ප්‍රධානත්වයෙන් පැවති ලේකම්වරුන්ගේ රැස්වීමේදී ඉදිරිපත් කරන ලද කරුණු සම්බන්ධව පහත දක්වා ඇති තීරණයන්ට එළඹෙන ලදී.

| අනු අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01. | අභ්‍යාසලාභී උපාධිධාරීන් සඳහා පත්වීම් ලබා දීම හා රාජකාරී සඳහා ස්ථානගත කිරීම සම්බන්ධව | සංවර්ධන නිලධාරීන් සඳහා පත්වීම් ලබා දීම සම්බන්ධව ප්‍රධාන ලේකම් විසින් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) ගෙන් විමසීම් සිදු කරන ලදී.<br>ඒ අනුව මේ වන විට සංවර්ධන නිලධාරීන් 3504 ක් සඳහා පත්වීම් ලබා දීමට කටයුතු කළ බවත් ,තවත් 213 දෙනෙකු සඳහා පත්වීම් ලබා දීමට ඉල්ලුම්පත් කැඳවා ඇති බවත් ,පළාත් සභාවට අනුයුක්ත කරන ලද තවත් 461 දෙනෙකු සඳහා අප්‍රේල් මාසයේ පත්වීම් ලබා දීමට නියමිතව පවතින බවත් , තවත් 887 දෙනෙකුට පත්වීම් ලබා දීම සඳහා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇති අතර මේ වන විට පළාත් සභාවට අනුයුක්ත විය යුතුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවය කරන අභ්‍යාසලාභී උපාධිධාරීන් පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තොරතුරු රැස් කරමින් පවතින අතර ඉදිරියේදී ඔවුන්ට පත්වීම් ලබා දීමට සිදුවන බවත් ඒ අනුව 6000 කට ආසන්න පිරිසක් සංවර්ධන නිලධාරීන් ලෙස පත්වීම් ලබා දෙන බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br>ඒ අනුව නව පත්වීම් ලබා දෙන සියලුම නිලධාරීන්ට ඔවුන්ට ගැලපෙන ක්ෂේත්‍රයන්හි රාජකාරී සඳහා යෙදවීමට කටයුතු කර අදාළ කාර්යයන් සඳහා රාජකාරී ලයිස්තුවක් ලබාදී වගකීම් පවරා රාජකාරීවල යෙදවීමට කටයුතු කරන ලෙසත් ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී.<br>ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල 13 සඳහා අලුතින් පත්වීම් ලබා දෙන සංවර්ධන නිලධාරීන්ගෙන් එක් කාර්යාලයකට එක් අයකු බැගින් ලබා දෙන ලෙස නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු ) විසින් ඉල්ලීමක් ඉදිරිපත් කල අතර සෞඛ්‍ය , කෘෂිකර්ම, පළාත් පාලන අමාත්‍යාංශ වලින් පවතින පුරප්පාඩු සඳහා සංවර්ධන නිලධාරීන් ලබා දෙන ලෙස ඉල්ලීම් සිදුකර ඇති අතර කාර්යක්ෂම සේවාවක් සපයාගත හැකි අයුරින් ගලපා නිලධාරීන් යෙදවීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) |

| | | | |
|---|---|---|---|
| 02. | 2022 වර්ෂයේ දී සිදු කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති සැලසුම් සම්බන්ධව | මේ සම්බන්ධයෙන් වර්තමාන තත්ත්වය පිළිබඳ ප්‍රධාන ලේකම් විසින් විමසා සිටි අතර , කාර්තු වශයෙන් ප්‍රතිපාදන ලබා දෙන බැවින් එම කාර්තුව තුල ව්‍යාපෘතිය සිදුකර අවසන් කල යුතු බවත් ප්‍රතිපාදන ඉල්ලුම්කර එම කටයුතු සිදු නොකලහොත් එහි වගකීම එම අමාත්‍යාංශ ලේකම්වරුන් විසින් භාරගත යුතු බවට ප්‍රධාන ලේකම් විසින් අවධාරණය කරන ලදී.<br>එමෙන්ම ව්‍යාපෘති අනුමත කිරීම පමණක් ප්‍රමාණවත් නොවන බවත් අමාත්‍යාංශ ලේකම්වරුන්ගෙන් නිරන්තරයෙන් ඒ පිළිබඳ විමසීම් සිදුකොට උපදෙස් ලබා දීම සැලසුම් අංශයෙන් සිදුකල යුතු බවත් , ආණ්ඩුකාරතුමාටද පිටපතක් සහිතව සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්ට නැවත සිහිගැන්වීමේ ලිපියක් යැවීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී.<br>තවද, සෞඛ්‍ය අංශ සංවර්ධන වැය, අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය හා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන වලින් ලබාදෙන ප්‍රතිපාදන අමාත්‍යාංශ වලට ලබා දීම සඳහා අදාළ ව්‍යාපෘති අනුමත වී ඇත්ද යන්න පිළිබඳ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) විසින් විමසා සිටින ලද අතර ඒ අනුව සෞඛ්‍ය අමාත්‍යාංශය හා අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරු විසින් තම අමාත්‍යාංශවල ව්‍යාපෘති අනුමත වී ඇති බව ප්‍රකාශකල අතර පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන මගින් ප්‍රතිපාදන ලැබෙන ව්‍යාපෘතිද අනුමත වී ඇති බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම් ) විසින් ප්‍රකාශ කරන ලදී.<br>තවද අමාත්‍යාංශ ලේකම්වරුන් තමන්ගේ වගකීමක් ලෙස සලකා සැලසුම් අධ්‍යක්ෂකවරුන්ගෙන් නිරන්තරයෙන් වාර්තා ලබාගෙන තමා අපේක්ෂා කරන ඉලක්කයට ලගාවී ඇතිද යන්න පිළිබඳ පරීක්ෂාකාරී වන ලෙසත් පසුගාමී තත්ත්වයක් පවතීනම් ඒ පිළිබඳ අවධානය යොමුකර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන ලෙසත් ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ( සැලසුම් )<br><br>සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් |
| 03. | 2022 වර්ෂයේදී ආයතන සඳහා කාර්ය සාධන තරඟාවලිය පැවැත්වීම | පවතින වාතාවරණය අනුව කොවිඩ් ආසාදිත නිලධාරින් නිරන්තරයෙන් වාර්තාවන බැවින් අවම කාර්යය මණ්ඩලයකින් කාර්යාල කටයුතු සිදුකරගෙන යන බවත්, ඒ අනුව මෙම වර්ෂයේදී කාර්ය සාධන තරඟාවලිය සඳහා සූදානම් වීමේ අපහසුතාවක් පවතින බැවින් ලබන වසරේදී එය පැවැත්වීමට කටයුතු කරන ලෙස නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය ) විසින් ඉල්ලීමක් සිදු කරන ලදී.<br>ඒ අනුව සියලුම අමාත්‍යාංශ ලේකම්වරු හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්ගේ අත්සනින් යුතුව පවතින අපහසුතාවය සඳහන් කර මේ පිළිබඳ සලකා බලන ලෙස ආණ්ඩුකාරතුමාගේ අවධානය සඳහා තමා වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් |

| | | | |
|---|---|---|---|
| 04. | පළාත් සභා සංකීර්ණයේ පවතින සියලුම ආයතන ආවරණය වන පරිදි CCTV කැමරා පද්ධතියක් සවි කිරීම සම්බන්ධව | මේ සම්බන්ධයෙන් වර්තමාන ප්‍රගතිය පිළිබඳ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු ) වෙතින් විමසා සිටි අතර එහිදී එම ඇස්තමේන්තුව සකස් කරනු ලබන්නේ තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරිය විසින් බවත් , ඒ අනුව ආවරණය විය යුතු ස්ථාන පිළිබඳව ඔවුන් දැනුවත් කල යුතු බවත් ඉන්පසු දින දින 10ක් ඇතුලත ඇස්තමේන්තුව ලබාදිය හැකි බවට අධිකාරිය විසින් දැනුම් දුන් බවත් , නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු ) විසින් ප්‍රකාශකර සිටින ලදී.<br>ඒ අනුව සියලුම අමාත්‍යාංශ , දෙපාර්තමේන්තු මෙන්ම පොදු ස්ථාන ආවරණය වන පරිදි එය සකස් විය යුතු බව ප්‍රධාන ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී.<br><br>ඒ අනුව මාණ්ඩලික නිලධාරීන්ගේ කාමරද ඒ සඳහා ඇතුලත් කල යුතුද යන්න සාකච්ඡා කල අතර වියදම පිළිබඳ සලකා බැලීම සඳහා එම කාමර ඇතුලත් කර හා ඇතුලත් නොකර ඇස්තමේන්තු දෙකක් ලබා දීමට කටයුතු කරන ලෙසට තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ වෙත දැනුම් දෙන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී.<br>තවද අමාත්‍යාංශවල CCTV කැමරා පද්ධතිය අමාත්‍යාංශ ලේකම්වරුන්ටද , දෙපාර්තමේන්තුවල CCTV කැමරා පද්ධතිය දෙපාර්තමේන්තු ප්‍රධානින්ටද , සියලුම කැමරා පද්ධතීන් ප්‍රධාන ලේකම් හා ආණ්ඩුකාරතුමාට නිරීක්ෂණය කලහැකි වන පරිදි මෙම කැමරා පද්ධතිය සකස් කිරීමට කටයුතු කරන ලෙසද ප්‍රධාන ලේකම් විසින් තව දුරටත් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු ) |
| 05. | කාර්යාල කටයුතු සඳහා තොරතුරු තාක්ෂණය යොදා ගැනීම සම්බන්ධව | මානව සම්පත් කළමනාකරණ තොරතුරු පද්ධතිය සකස් කිරීමේ කටයුතු මෙම වසරේදී අවසන් කල යුතු බවත් , වර්තමාන තත්ත්වය පිළිබඳ වාර්තාවක් තමා වෙත ලබා දීමට කටයුතු කරන ලෙසත් ප්‍රධාන ලේකම් විසින් දන්වා සිටින ලදී.<br>සේවා ලාභීන් වෙනුවෙන් සිදුකරන මහජන සේවාවන් මේ වන විටත් බොහොම ප්‍රාථමික මට්ටමක පවතින බැවින් අභ්‍යන්තර හෝ බාහිර සේවාලාභීන් වෙනුවෙන් සපයන සේවා ඔවුන් තෘප්තිමත් වන පරිදි කාර්යක්ෂමව ඉටුකර දීමට හැකි පසුබිමක් සකස්කල යුතු බව ප්‍රධාන ලේකම් විසින් අවධාරණය කරන ලදී. ඒ ඒ අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතනවලට කෙලින්ම අන්තර්ජාලය හා සම්බන්ධවී තම තමන්ගේ ප්‍රශ්න කෙලින්ම විසඳා ගැනීම සඳහා පසුබිමක් සකස් කරන ලෙස තමා විසින් ඉල්ලුම්කල බවද ප්‍රධාන ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු ) |

| | | | |
|---|---|---|---|
| 06. | පාසැල් හා කාර්යාල ගෙවතු වගා වැඩසටහන සම්බන්ධව | මේ පිළිබඳ වර්තමාන තත්ත්වය පිළිබඳ ප්‍රධාන ලේකම් විසින් විමසා සිටින ලදී. ඒ අනුව අධ්‍යාපන අමාත්‍යාංශ මඟින් මේ වන විට කලාප 11 ට අදාළ කෘෂිකර්ම විෂය අධ්‍යක්ෂවරුන් කැඳවා තරඟ සංවිධානය හා පාසැල් මට්ටමින් දැනුවත් කිරීම සම්බන්ධව ඇස්තමේන්තු සකස්කර මූලික කටයුතු සිදුකර අවසන් බවත් පාසැල් විවෘත කල වහාම එම ව්‍යාපෘති දියත් කිරීමට කටයුතු කරන බව අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී.<br>තවද පළාත් පාලන ආයතන වලට අමාත්‍යාංශ මට්ටමින් මේ පිළිබඳ දැනුවත් කිරීම් සිදුකොට ඔවුන්ගේ අවධානය යොමු කිරීම සඳහා කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් දැනුවත් කරන ලදී.<br>එමෙන්ම මාර්ග දෙපස ඉඩකඩ ඇති බිම් කොටස්ද මේ සඳහා භාවිතා කල හැකි බවත් ඒ පිළිබඳ මාර්ග හා ප්‍රවාහන අමාත්‍යාංශ ලේකම්ගේ අවධානය යොමුකරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී.<br>කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් සැලසුම් සකස්කර දුන් පසු පොදු චක්‍රලේඛයක් සකස්කර ලබා දෙන තෙක් සියලුම අමාත්‍යාංශ මඟින් ඒ පිළිබඳ නිර්මාණශීලී ලෙස අමාත්‍යාංශ යටතේ ආයතන මට්ටමින් පවතින ඉඩකඩ ප්‍රමාණය අනුව වගා කටයුතු සම්බන්ධව අවධානය යොමුකර ඒ සඳහා ක්‍රියාත්මක වන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | ලේකම් ( අධ්‍යාපන අමාත්‍යාංශය)<br>සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්<br>ලේකම් ( අධ්‍යාපන අමාත්‍යාංශය)<br>ලේකම් (කෘෂිකර්ම අමාත්‍යාංශය) |
| 07. | කාර්ය සාධන බලකාය සඳහා බඳවාගත් පිරිසට පත්වීම් ලබා දීම හා වැටුප් ගෙවීම සමන්ධව | කණිෂ්ඨ සේවක පුරප්පාඩු රැසක් පවතින බැවින් ඒ සඳහා කාර්ය සාධන බලකායට බඳවාගත් අයගෙන් පුරප්පාඩු පිරවීමට පිරිස ලබා දෙන ලෙස ඉල්ලීමක් සිදුකල බවට අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br>එම බඳවාගත් පිරිස අවම අධ්‍යාපන සුදුසුකම් හෝ සම්පූර්ණ කර නොමැති අතර වෘත්තීය සුදුසුකම් සඳහා අවශ්‍ය පුහුණුව හෝ සම්පූර්ණ කර නොමැති බැවින් ඔවුන්ට පත්වීම් ලබා දීමේ ගැටලුව සමන්ධව හා 2023 වසර සිට ඔවුන්ට වැටුප් ගෙවීමට ප්‍රතිපාදන ඉල්ලීමේ ගැටළුව සම්බන්ධව දීර්ඝ ලෙස සාකච්ඡා කිරීමෙන් පසුව මේ සම්බන්ධව රජය විසින් ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීමෙන් පසු අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනිමට තීරණය කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය / පිරිස් පුහුණු) |

| | | | |
|---|---|---|---|
| 08. | අවසාන ගිණුම් ඉදිරිපත් කිරීම සම්බන්ධව | 2022.02.28 දිනට අවසාන ගිණුම් ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතු අතර සියළුම දෙපාර්තමේන්තු , අධිකාරී, පළාත් පාලන ආයතන ඒ පිළිබඳ දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසත් , එම අවසාන ගිණුම් භාෂාත්‍රිත්වයෙන්ම ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙසත් සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් දැනුවත් කරන ලෙස නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) විසින් ඉල්ලා සිටින ලදී.<br>ඒ අනුව මේ පිළිබඳ විශේෂ අවධානය යොමුකර ප්‍රමාද නොකර එම ගිණුම් විස්තර ලබා දීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් අවධාරණය කරන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් |
| 09. | විදුලි බල පරිභෝජනය අවම කිරීම සම්බන්ධව | බස්නාහිර පළාත් සභා ප්‍රධාන ගොඩනැගිල්ල සඳහා විශාල වශයෙන් විදුලි බලය භාවිතා කෙරෙන අතර ඒ සඳහා මාසිකව රු.මිලියන 05 කට අධික පිරිවැයක් දැරීමට සිදුවන බවත් ඒ අනුව විදුලි බලය පරිභෝජනය අවම කර ගැනීම සඳහා මූලස්ථාන ඉංජිනේරු වෙතින් ලබාගත් වාර්තාව අනුව ගත යුතු පහත සඳහන් ක්‍රියා මාර්ග පිළිබඳ දීර්ඝ ලෙස සාකච්ඡා කරන ලදී.<br>01. විදුලි බුබුළු භාවිතය අවම කිරීම<br>02. වායු සමීකරණ පද්ධතිය විධිමත්ව භාවිතා කිරීම<br>03. ජල සැපයුම් උපකරණ ( Water Dispenser) විධිමත්ව භාවිතා කිරීම<br>04. විදුලි සෝපාන පද්ධතිය විධිමත් භාවිතය<br>05. විදුලි උපකරණ භාවිතය අවම කිරීම<br>I. පරිගණක ,ඡායා පිටපත් ස්කෑන් ආදී යන්ත්‍ර භාවිකය<br>II. විදුලි ජේනු අවභාවිතය<br>මේ සම්බන්ධයෙන් ඉදිරියේදී චක්‍රලේඛය සියලුම අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු / ආයතන වෙත නිකුත් කිරීමට කටයුතු කරන අතර මෙම කරුණු පිළිබඳ අධීක්ෂණය කිරීම සඳහා වගකිවයුතු නිලධාරියකු පත් කරන ලෙසත් එම නිලධාරියාගේ නම හා විස්තර තමා වෙත ලැබීමට සලස්වන ලෙසත් ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී.<br>පරිගණක යන්ත්‍ර සඳහාද විශාල විදුලි බිලක් වැයවන අතර බොහෝ විට රාජකාරී අවසන්කල පසු ඇතැම් පරිගණක යන්ත්‍ර සඳහා විදුලිය සපයන විදුලි බොත්තම විසන්ධි කිරීමක් සිදු නොකරන නිලධාරීන් පිළිබඳ ආයතන ප්‍රධානියා දැනුවත් කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් වැඩි දුරටත් උපදෙස් ලබා දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් |

| | | | |
|---|---|---|---|
| 10. | කාර්යාල ප්‍රවාහන බස් රථ පෙ.ව. 8.00 ට කාර්යාලය වෙත පැමිණීමේ ඇති හැකියාව සම්බන්ධව | පවතින කොවිඩ් තත්ත්වය මත කාර්යාලීය බස්රථ මගින් ප්‍රවාහන පහසුකම් සපයා ගැනීම වඩාත් ආරක්ෂාකාරී හා වාසිදායක වන අතර මෙම පරිශ්‍රයේ කාර්යාල බොහොමයක කා.කා.ස මහත්ම මහත්මීන් මෙම බස්රථ භාවිතා කරමින් සේවයට පැමිණෙන බැවින් එම බස්රථ පෙ.ව 8.00 ට හෝ 8.00ට පෙර පළාත් සභා පරිශ්‍රයට පැමිණීමේ හැකියාව තිබේනම් ඔවුන්ට පෙ.ව.8.00 ට පෙර පැමිණ ප.ව 4.15 ට පිටවීමට අවස්ථාව ලබා දීමට ඇති හැකියාව සම්බන්ධයෙන් ආණ්ඩුකාර ලේකම් විසින් යෝජනාවක් ඉදිරිපත් කර තිබුණි.<br>ඒ පිළිබඳ කරුණු සාකච්ඡා කිරීමෙන් පසුව මෙය ක්‍රියාත්මක කිරීමේදී ප්‍රායෝගික වශයෙන් ගැටළු මතුවන බවත් කා.කා.ස මහත්ම මහත්මීන් පැමිණෙන බස් රථවල ගමන් ගන්නා නිලධාරීන් සාකච්ඡා කර මෙය ක්‍රියාත්මක කිරීම පිළිබඳ තීරණය කිරීම සුදුසු බවත් ප්‍රධාන ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 11. | තාක්ෂණික නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාග ප්‍රතිපල පෞද්ගලික ලිපි ගොණුවට ඉදිරිපත් නොවීම සම්බන්ධව | තාක්ෂණික නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාග ප්‍රතිඵලවල පෞද්ගලික ලිපි ගොණුවේ පිටපත පෞද්ගලික ලිපි ගොනුවට ඉදිරිපත් නොවීම මත වැටුප් වර්ධක ලබාදීම සම්බන්ධව ගැටළුවක් පවතින බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br>ඒ අනුව ප්‍රාදේශිය ඉංජිනේරු කාර්යාලවල තාක්ෂණික නිලධාරීන්ගේ වැටුප් වර්ධක ලබා දීමට අදාළ ලේඛණවල පිටපත් පෞද්ගලික ලිපි ගොනුවට ඇතුලත්කර යාවත්කාලීන කිරීමට ක්‍රියා මාර්ග ගැනීම සඳහා යම් දිනයක් ලබා දී එම දිනයට පෙර එය යාවත්කාලීන කිරීමට කටයුතු කරන ලෙසත්, එසේ නොකල හොත් විෂය භාර නිලධාරිනිගේ රාජකාරී කටයුතු සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බවත් දන්වා යවන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන / ඉංජිනේරු) |
| 12. | පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂ කාර්යාලයට නව පත්වීම් ලබා දී ඇති සංවර්ධන නිලධාරීන්ගේ ගමනා ගමන ගැටළුව සම්බන්ධව | පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂ කාර්යාලයට නව පත්වීම් ලබා දී ඇති සංවර්ධන නිලධාරීන් 7 දෙනෙකු සඳහා ගමනාගමන කටයුතු හේතුවෙන් මහත් අපහසුතාවට පත්ව ඇති බව සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br>නව පත්වීම් ලබා දීමට නියමිත සංවර්ධන නිලධාරීන් 887 අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල මධ්‍යම රජය යටතේ පුහුණුව ලබා ගත් පළාත් සභාවට අනුයුක්ත වීම සඳහා ඉල්ලුම් කරන ලද පිරිසක් සිටින අතර මෙතෙක් ඔවුන්ට රාජකාරී ස්ථානයක් ලබා දී නොමැති බැවින් ඔවුන් ඒ සඳහා යොදවා එම අපහසුතා පවතින නිලධාරීන්ට පහසු ස්ථානයකට ස්ථාන මාරු ලබා දිය හැකි බවට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ( පිරිස් පුහුණු ) විසින් ප්‍රකාශ කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ( පිරිස් පුහුණු ) |

| | | | |
|---|---|---|---|
| 13. | ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලවල අලුත්වැඩියාවන් හා පරිගණක ලබා ගැනීම සම්බන්ධව | ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල බොහොමයක අලුත් වැඩියාවන් සිදු කිරීමට සිදුව ඇති බවත් , රාජකාරී කටයුතු සඳහා නව පරිගණක ලබා ගැනීමට අවශ්‍යාව ඇති බවත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ( ඉංජිනේරු ) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br>මේ වන විට පවතින තත්ත්වය අනුව භාණ්ඩ මිලදී ගැනීම් සීමා කරන ලෙස භාණ්ඩාගාරය විසින් දන්වා ඇති බැවින් මෙය යථා තත්ත්වයට පත්වන තෙක් පවතින සම්පත් වලින් කටුයුතු සිදුකර ගැනීමට කටයුතු කරන ලෙසත්, ගොඩනැගිලි නවීකරණය සම්බන්ධයෙන් පළාත් සංවර්ධන ප්‍රධාන යටතේ නවීකරණ කටයුතු සඳහා ලැබෙන ප්‍රතිපාදන මත එම කටයුතු සිදු කිරීමට පවතින සක්‍යතාව පිළිබඳ සොයා බලා ඒ අනුව කටයුතු සිදු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ( ඉංජිනේරු ) |
| 14. | අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතන වලින් ඉල්ලා සිටින තොරතුරු ලබා දීමේ පවතින ප්‍රමාදය සම්බන්ධව | මහජන පෙත්සම් කාරක සභාව ඇතුළු විවිධ ආයතන වලින් විමසන ලද තොරතුරු ඒ ඒ ආයතන වෙතින් ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයක් පවතින බවට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br>අමාත්‍යාංශ ලේකම්වරුන්ගෙන් දෙපාර්තමේන්තු හා ආයතන ප්‍රධානීන්ගෙන් තොරතුරු විමසා යොමුකරන ලිපි ලේඛන වලට ප්‍රතිචාර දැක්වීමේ ප්‍රමාදයක් දක්නට ලැබෙන බවත් , විශේෂයෙන් පෙත්සම් කාරක සභාව , ගිණුම් කාරක සභාව මෙන්ම පාර්ලිමේන්තුවට යම් කාලයක් තුලදී ඉදිරිපත් කලයුතු පිළිතුරු සම්බන්ධව ප්‍රමාද වීම මත මුළු පළාත් සභාවම දෝෂ දර්ශනයට ලක්වන බවත් අප්‍රමාදව ඉල්ලා සිටින වාර්තාවන් නිවැරදිව සවිස්තරව ලබා දීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් අවධාරණය කරන ලදී.<br>මහජන පෙත්සම් කාරක සභාව මගින් ඉදිරිපත්කර තිබූ ගැටළුවක් සම්බන්ධව සීතාවක නගර සභාවේන් ලබාගත යුතු පිළිතුරක් ලබා දීමට මාස 5ක පමණ කාලයක් ප්‍රමාදව පවතින අතර මේ පිළිබඳ සොයා බලා කඩිනමින් පිළිතුරු එවීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම විසින් පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ට උපදෙස් ලබා දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් |

ජේ.එම්.සී. ජයන්ති විජේතුංග,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.